දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2014 ප්‍රථම වර පරීක්ෂණය - 2017 අප්‍රේල්
Bachelor of Arts General (External) Degree Part I Regular Examination 2014 - April 2016

සිංසා 2.2 - සිංහල නාට්‍ය හා රංග කලාව
SLG 2.2 - Sinhala Drama and Theatre

කාලය පැය තුන යි

එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

## I කොටස

01. "නාට්‍ය වනාහි සම්මිශ්‍රිත හා සජීවී කලා මාධ්‍යයකි" මේ කියමන සනාථ කරන්න.

02. කාලීන සමාජ ගැටලුවක් පාදක කර ගත් වේදිකා නාට්‍යයක් නිර්මාණය කිරීම සඳහා වඩාත් සුදුසු නාට්‍ය ශෛලිය කුමක් දැයි නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

03. නාට්‍යයක් වඩාත් රසවත් වීමට එහි කථා වස්තුව හා අභිනය භාවිතය අතර පැවතිය යුත්තේ කවර ආකාරයේ සම්බන්ධයක් දැයි නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

04. ශ්‍රී ලංකාවේ "සොකරි" පිළිබඳ හැදෑරීමක් නො කළ කෙනෙකුට එහි පැනෙන විශේෂතා ද පැහැදිලි වන සේ ලිපියක් සම්පාදනය කරන්න.

## II කොටස

05. සිංහබාහු නාටකයේ ඔබ සිත් ගත් චරිත ද්වයක විශේෂ ලක්ෂණ නිරීක්ෂණයට ලක් කරන්න.

06. "රත්නාවලී නාට්‍යයේ ප්‍රධාන චරිත අතර පවතින ගැටුම නාට්‍යයේ රසය තීව්‍ර කරයි" ඔබේ මතය සාධනය කරන්න.

07. "සමස්ත නාට්‍යයේ සිදුවීම් අතර මනා සහසම්බන්ධයක් ගොඩ නැගීම වෙනුවෙන් ශාකුන්තලා නාට්‍යයේ ඇතුළත් අහඹු සහ අද්භූත සිදුවීම් සුවිශේෂී දායකත්වයක් සපයයි." නිදර්ශන සහිතව සාකච්ඡා කරන්න.

08. පහත දැක්වෙන මාතෘකා අතුරින් දෙකක් පිළිබඳව ප්‍රමාණවත් විවරණ සපයන්න.
    I. ශ්‍රී ලංකාවේ පාරම්පරික රූකඩ නාට්‍ය
    II. වේදිකා ආලෝකකරණයේ වැදගත්කම
    III. අංග රචනය

**************************************